# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1324/18 - 2004 ජනවාරි 21 වැනි බදාදා - 2004.01.21

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

විධාන අංක - 3.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10 (1) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 (1) වැනි වගන්තිය යටතේ ක්‍රියාකරමින්, මෙහි උපලේඛනයේ දැක්වෙන භාණ්ඩ සාදන්නන් සහ වෙළඳුන් වෙත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙසේ විධාන කරයි.

භාණ්ඩයේ හෝ ඇසුරුමේ හෝ බහාලුවේ හෝ දවටනයේ,

(අ) උපරිම සිල්ලර මිල ලකුණු කරන ලෙස,
(ආ) නිෂ්පාදන කාණ්ඩ අංකය සටහන් කරන ලෙස, සහ
(ඇ) කල් ඉකුත් වන දින සටහන් කරන ලෙස.

මෙම විධානය 2004 අප්‍රේල් මස 20 වන සිට බලපැවැත්වෙනු ඇත.

උපලේඛනය

01. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන පිටි (ධාන්‍ය වර්ග වලින් හෝ ඇට වර්ග වලින් සාදන ලද)
02. සබන් (සුවඳ සබන්, ආයුර්වේද සබන්, විෂබීජ නාශක, රැවුල කැපීමට භාවිතා කරන, මෘදු, දියර, ළදරු, රෙදි සෝදන)
03. රෙදි සෝදන කුඩු (පතුරු සහ පෙති)
04. ළදරු නිෂ්පාදිත (ෂැම්පු, තෙල්, පුයර, බෙහෙත් වතුර)
05. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන කේක් සහ කැවිලි වර්ග වැනි රස කැවිලි
06. දන්තාලේප
07. බැටරි (විදුලි පන්දම් සහ ට්‍රාන්සිස්ටර්)
08. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන සීනි
09. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන ඇට හා ධාන්‍ය වර්ග
10. ඇසුරුම්වල විකුණන පාන්

1A-G 003995 - 1,540 (2001/01)

## උපලේඛනය (සම්බන්ධිතයි)

11. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන කරවල හා උම්බලකඩ
12. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන කේජු (චීස්)
13. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන කිත්තර
14. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන මුදවාපු කිරි
15. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන දියර කිරි (ශුද්ධ, රස වර්ග හෝ පැණිරස එකතු කරන ලද)
16. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන බීම සාදන කුඩු වර්ග
17. බෝතල්වල විකුණන පානීය ජලය.
18. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන නූඩ්ල්ස්
19. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන සෝයා නිෂ්පාදන
20. ඇසුරුම්වල හෝ බහාලනවල විකුණන අමු, බදින ලද, ලුණු හෝ රසකාරක අඩංගු අල වර්ගවලින් නිෂ්පාදිත ආහාර, රටකජු, කජු මිද වැනි ඇට වර්ග හා එවැනි සෘජුවම පාරිභෝජනය කළ හැකි ආහාර වර්ග.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

ආර්. අයි. විමලසේන,
සභාපති.

2004 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

02-136

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.